# මාසික වැඩසටහන 2013 - සැප්තැම්බර්

පසුගිය "ඉරිදා ලක්බිම" පුවත්පතේ කලාප කීපයක් ඔස්සේ, තිලක් සේනාසිංහ මහතා සහ කපු මහතෙකු අතර සිදුවූ සංවාදය , කපු මහතාගේ දේවාලය අභිමුවටම ගොස් අභියෝග කොට ඔහු පරාජයට පත්කිරීමෙන් අනතුරුව නිමාවට පත්විය.

මෙලෙස තනි තනි කට්ටඩි-කපු මහතුන් හා සමග ප්‍රසිද්ධ ජනමාධ්‍ය ඔස්සේ නිෂ්පල සංවාදයන් මුලපුරා, මෙවැනි ප්‍රාථමික මට්ටමේ කවටයින් හට ව්‍යාපාරික ප්‍රතිලාභ අත්කරදෙන ප්‍රසිද්ධියක් හිමිකරදී (අවසානයේ එක් නිමේශයකට පමණක් එවැන්නන් "පරාජයට" පත්කිරීමේ) ව්‍යාපෘති වල අවසාන ශේෂ පත්‍රය වනාහි සමාජයට හෝ ප්‍රගතිශීලී සමාජ ව්‍යාපාරයකට හෝ වාසිදායක එකක් නොවන බවට අපගේ තක්සේරුවයි . මේ ජවනිකාවේ අවසන් ප්‍රතිපලයද (දීර්ඝකාලීන අර්ථයෙන්) එබව යලිත් පෙන්නුම් කොට ඇත.

කෙසේමුත් මේ කාරණය අරබයා වන පසු විමසුමක් ඉදිරිපත් කිරීමට අපි තිලක් සේනාසිංහ මහතාට හා මනෝ වෛද්‍ය විශේෂඥ රූමි රූබන් මහතාටද මෙවර අපෙගේ මාසික වැඩසටහන වෙනුවෙන් ඇරයුම් කළෙමු.

ඊට අමතරව, ඇඟිල්ලෙන් දෙහි කැපීම, දෙහි ගෙඩියෙන් රුධිරය ගැනීම, උතුරන තෙල් තාච්චියට අත දැමීම හා වෙනත් එවැනි ආකාරයේ ප්‍රදර්ශනයන් කිහිපයක් ඉදිරිපත් කිරීමට නිරූපිකාවකට ද මෙදින ඇරයුම් කොට ඇත.

ස්ථානය : ආචාර්ය එන්. එම්. පෙරේරා මධ්‍යස්ථානය .

දිනය සහ වෙලාව : 2013 සැප්තැම්බර් 27 වන සිකුරාදා ප. ව. 4.15

දේශනය සැමට විවෘතයි !

තාරක වරාපිටිය

ලේකම්